# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

**2019 ඔක්තෝබර්**

**වෙළුම 01 නිකුතුව 06**


## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





2019 ඔක්තෝබර් මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 977 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.2 කින් සුළු වශයෙන් පහත වැටුණි.

### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2019 ඔක්තෝබර් මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,816 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.5 කින් පහත වැටුණි.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




2019 වසරේ පළමු මාස දහය තුළදී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 0.8 කින් ඉහළ ගිය අතර, ආනයන වියදම සියයට 12.4 කින් පහත වැටුණි.


### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2018 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව 2019 ඔක්තෝබර් මාසයේදී වෙළඳ හිඟය අඩු විය. 2019 වසරේ පළමු මාස දහය තුළදී වෙළඳ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,405 කින් කැපී පෙනෙන ලෙස අඩු විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ (2019 ජන.-ඔක්.)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

අපනයන ක්‍රියාකාරිත්වය (ජන.-ඔක්.)




අපනයන පරිමා දර්ශකය (ජන.-ඔක්.)





කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන පහත වැටුණද 2019 වසරේ පළමු මාස දහය තුළදී කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය.


කාර්මික අපනයන සහ කෘෂිකාර්මික අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් 2019 වසරේ පළමු මාස දහය තුළදී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


කෘෂිකාර්මික අපනයන ආදායම





කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශක සහ මිල දර්ශක




කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-ඔක්.)




තේ සහ රබර් මිල ගණන් *





*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වේ


මිල ගණන් පහත වැටීම හේතුවෙන් තේ, කුළුබඩු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම දුර්වල වීම සමග 2019 වසරේ පළමු මාස දහය තුළදී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී පොල්, මුහුදු ආහාර සහ එළවළු අපනයන ආදායම ඉහළ ගියේය.

# කාර්මික අපනයන


### කාර්මික අපනයන ආදායම





### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-ඔක්.)





### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





රෙදිපිළි හා ඇඟලුම්, ප්‍රවාහන උපකරණ සහ සත්ත්ව ආහාර අපනයනවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2019 වසරේ පළමු මාස දහය තුළදී කාර්මික අපනයන ආදායම ඉහළ ගියේය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි බොරතෙල් මිල ගණන් පහත වැටීම හා සමගාමීව නැව් සඳහා යොදාගනු ලබන ඉන්ධන මිල ගණන් පහත වැටීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම පහත වැටුණි. 2018 වසරේ පළමු මාස දහයට සාපේක්ෂව මෙම කාලපරිච්ඡේදයේදී කාර්මික අපනයන පරිමාව ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-ඔක්.)





### ආනයන පරිමා දර්ශකය (ජන.-ඔක්.)





සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2019 වසරේ පළමු මාස දහය තුළදී ආනයන වියදම පහත වැටුණි.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-ඔක්.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





විශේෂයෙන්ම පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන සහ සහල්, සීනි, එළවළු හා කිරි නිෂ්පාදිත වැනි ආහාර අයිතම ආනයනය පහළ යෑම හේතුවෙන් 2019 වසරේ පළමු මාස දහය තුළදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. (මෙම රූප සටහනෙහි සහල්, සීනි සහ කිරි නිෂ්පාදිත වෙනත් කාණ්ඩයෙහි ඇතුළත් කොට ඇත.) මීට අමතරව, 2019 වසරේ පළමු මාස දහය තුළදී විදුලි සංදේශ මෙවලම්, රෙදිපිළි හා උපාංග සහ ගෘහ උපකරණ වැනි ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනද පහත වැටුණි.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-ඔක්.)**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**





*2018 පෙබරවාරි මාසයේදී බොරතෙල් ආනයනය කර නොමැත.


ප්‍රධාන වශයෙන් රත්‍රන්, ඉන්ධන සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන පහළ යෑම හේතුවෙන් 2019 වසරේ පළමු මාස දහය තුළදී අන්තර් භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, ඇඟලුම් අපනයන ඉහළ යෑමට සමගාමීව රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගිය අතර, සිමෙන්ති ක්ලින්කර ආනයන ඉහළ යෑමත් සමග ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයනය


**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-ඔක්.)**




ප්‍රවාහන උපකරණ හා යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ කාණ්ඩවල ආනයන පහළ යෑම හේතුවෙන් 2019 වසරේ පළමු මාස දහය තුළදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ඔක්-18 | ඔක්-19 | වෙනස (%) | ජන - ඔක් 2018 | ජන -ඔක් 2019 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **217.3** | **210.2** | **-3.3** | **2,175.0** | **2,079.1** | **-4.4** |
| එයින් | තේ | 115.5 | 113.8 | -1.5 | 1,208.2 | 1,139.1 | -5.7 |
| | පොල් | 28.6 | 26.3 | -8.0 | 266.7 | 284.8 | 6.8 |
| | තුළුබඩු | 33.2 | 32.6 | -1.9 | 302.5 | 267.4 | -11.6 |
| | මුහුදු ආහාර | 23.3 | 19.2 | -17.7 | 214.4 | 219.6 | 2.4 |
| **කාර්මික අපනයන** | | **757.4** | **762.1** | **0.6** | **7,657.0** | **7,839.0** | **2.4** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 426.6 | 441.6 | 3.5 | 4,354.5 | 4,628.4 | 6.3 |
| | රබර් නිෂ්පාදිත | 71.4 | 70.3 | -1.6 | 727.6 | 732.5 | 0.7 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 58.5 | 41.5 | -29.1 | 512.3 | 408.5 | -20.3 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 42.7 | 38.7 | -9.5 | 389.9 | 376.0 | -3.6 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 35.8 | 33.4 | -6.6 | 364.2 | 341.4 | -6.2 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.3 | 30.0 | 23.5 | 238.8 | 254.6 | 6.6 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 9.1 | 7.0 | -23.2 | 128.2 | 89.2 | -30.4 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **4.4** | **5.0** | **11.8** | **44.7** | **42.3** | **-5.4** |
| **මුළු අපනයන** | | **979.1** | **977.3** | **-0.2** | **9,876.7** | **9,960.5** | **0.8** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ඔක්-18 | ඔක්-19 | වෙනස (%) | ජන - ඔක් 2018 | ජන -ඔක් 2019 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **438.5** | **383.3** | **-12.6** | **4,259.1** | **3,195.3** | **-25.0** |
| **ආහාර හා පාන වර්ග** | | 121.2 | 128.9 | 6.3 | 1,360.4 | 1,138.2 | -16.3 |
| එයින් | සහල් | 1.0 | 1.5 | 53.1 | 102.5 | 10.1 | -90.1 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 317.3 | 254.4 | -19.8 | 2,898.7 | 2,057.1 | -29.0 |
| එයින් | පෞද්ගලික රථවාහන | 160.8 | 84.6 | -47.4 | 1,391.4 | 651.0 | -53.2 |
| **අන්තර් භාණ්ඩ** | | **1,017.5** | **1,040.2** | **2.2** | **10,430.3** | **9,420.7** | **-9.7** |
| එයින් | ඉන්ධන | 265.9 | 308.3 | 15.9 | 3,431.0 | 3,238.8 | -5.6 |
| | රත්‍රන් | 0.5 | 0.0 | -99.5 | 438.6 | 2.3 | -99.5 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 279.7 | 277.1 | -0.9 | 2,371.3 | 2,404.2 | 1.4 |
| | පොහොර | 23.1 | 27.4 | 18.5 | 210.9 | 194.9 | -7.6 |
| | තිරිඟු හා ඉරිඟු | 53.9 | 33.0 | -38.8 | 326.6 | 266.9 | -18.3 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **426.4** | **392.2** | **-8.0** | **4,044.1** | **3,795.8** | **-6.1** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 233.5 | 218.2 | -6.5 | 2,112.1 | 2,034.9 | -3.7 |
| **මුළු ආනයන** | | **1,882.5** | **1,815.7** | **-3.5** | **18,733.5** | **16,411.8** | **-12.4** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ඔක්-18 | ඔක්-19 | වෙනස (%) | ජන - ඔක් 2018 | ජන -ඔක් 2019 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -903.4 | -838.4 | - | -8,856.8 | -6,451.3 | - |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (අ)

| කාණ්ඩය | | ඔක්-18 | ඔක්-19 | වෙනස (%) | ජන - ඔක් 2018 | ජන -ඔක් 2019 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 136.3 | 136.0 | -0.2 | 137.5 | 138.6 | 0.8 |
| | පරිමා දර්ශකය | 127.8 | 145.4 | 13.8 | 134.7 | 144.6 | 7.4 |
| | මිල දර්ශකය | 106.7 | 93.5 | -12.3 | 102.1 | 95.8 | -6.1 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 168.5 | 162.5 | -3.5 | 167.7 | 146.9 | -12.4 |
| | පරිමා දර්ශකය | 185.3 | 192.3 | 3.8 | 175.1 | 162.0 | -7.5 |
| | මිල දර්ශකය | 90.9 | 84.5 | -7.0 | 95.8 | 90.6 | -5.3 |
| **වෙළඳ මිල අනුපාතය** | | 117.3 | 110.7 | -5.7 | 106.6 | 105.7 | -0.8 |

(අ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද